# 5. දූත සේවයක අසිරිය

**ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතයට හා සේවයට මඟ සැලසීම සඳහා ස්නාවක ජොහාන්තුමා විසින් ඉටුකරන ලද පෙරමඟ දූත සේවය ඉතා වැදගත් තැනක් ගනී. එම පෙරමඟ දූත සේවය හා ඉන් අපට උගත හැකි පාඩම් පිළිබඳව මෙම පාඩම මඟින් කරුණු විමසා බැලීම අපේක්ෂිත ය.**

## ශු. මතෙව් 3: 1-12

මසකට වරක් පවත්වන "වට මේසයේ සැඳෑවට" අදත් මිතුරු මිතුරියන් හැම දෙනා ම ඇවිත්. මේ හැම දෙනා ම ඉරුදින දහම් පාසලේ හා දින පාසලේ එකම පන්තියේ මිතුරු මිතුරියන්. පුරුදු පරිදි වට මේසයේ සැඳෑව මෙහෙයවන්න සුහද අයියාත් වේලාසනින් ම ඇවිත්. "හොඳයි නංගි මල්ලි අදත් අපි වට මේසයේ සැඳෑව පටන් ගනිමු. පසන් මල්ලි දෙව් යැදුමකින් අපට මඟ පෙන්වයි." පසන් මල්ලිගේ දෙව් යැදුමෙන් වට මේසයේ සැඳෑව ඇරඹුණා.

සුහද අයියා - අද සංවාද මාතෘකාව හඳුන්වා දෙන්නේ රංගන මල්ලි. (අත්පොළසන් හඬ) ඔව්. රංගන මල්ලි, මොකක්ද අද මාතෘකාව.

රංගන - අද අපි සාකච්ඡා කරන්නට යන්නේ, කිතුනු අප සැම දෙනාට ම ඉතාමත් වැදගත් මාතෘකාවක්. ඒ වගේ ම ශුද්ධ බයිබලයේ ශ්‍රේෂ්ඨ චරිතයකට අදාළ මාතෘකාවක්. එය තමයි ස්නාවක ජොහාන්තුමාගේ පෙරමග දූත සේවය.

සුහද අයියා - දැන් ආරම්භයේ දී ම සහනි නංගී ස්නාවක ජොහාන්තුමා පිළිබඳව කෙටි හැඳින්වීමක් ඉදිරිපත් කරයි.

සහනි - ස්නාවක ජොහාන්, සෙකරියස් සහ එළිසබෙත්ගේ මහලු වියේ ලැබුණු පුත්‍රයා යි. උපතේ දී පටන් ස්නාවක ජොහාන් විශේෂ දූත මෙහෙයකට කැප කළ කෙනෙක් බව ගාබ්‍රියෙල් දේවදූතයා සෙකරියස්ට ප්‍රකාශ කර තිබුණා.


සහද අයියා - මී ළඟ අවස්ථාව අමල් මල්ලීට.

අමල් - ස්නාවක ජොහාන්තුමාගේ "සේවයට සූදානම හා සරල දිවි පෙවෙත" පිළිබඳවයි මා ඔබ සමග අදහස් බෙදාගන්නේ.

## සමිඳුන්ගේ මාවත පිළියෙල කරන්න.
## එතුමන්ට ඇද නැති මාවත් සාදන්න යැයි
## පාළුකරයේ මොර ගා කියන හඬකි.
## (මතෙව් 3:3, යෙසායා 40:3)

දිවැසිවර යෙසායාතුමා වසර ගණනාවකට පෙර එම දිවැස්වැකිය පවසා ඇත්තේ ස්නාවක ජොහාන්තුමාගේ අති විශේෂ මෙහෙය ගැනයි. ජුදයේ පාළුකරයෙහි වෙසෙමින් ස්නාවක ජොහාන්තුමා මේ මෙහෙය වෙනුවෙන් විශේෂයෙන් සූදානම් වූ ආකාරය අපට පෙනෙනවා. එතුමා ගත කළේ ඉතාමත් සරල ජීවිතයක්. ස්නාවක ජොහාන්තුමා ඔටු ලෝම වස්ත්‍රයක් ඇඳ ඉනට සම් පටියක් බැඳ සිටියා. එතුමා ආහාරයට ගත්තේ පළගැටියන් හා වන මී. එතුමාගේ සරල ජීවිතය සේවයට විශාල පහසුවක් වුනා.

සුහද අයියා :-



ගොඩක් ස්තුතියි අමල් මල්ලී. දැන් ස්නාවක ජොහාන්තුමාගේ සේවයට සූදානම හා සරල දිවි පෙවෙත ඇසුරෙන් කිතුනු ජීවිතයට උපකාරකයක් ගෙන ඒමට දෙව්නි නංගිට අවස්ථාව.

දෙව්නි :-

ඕනෑම විශේෂ සේවාවක් කිරීමට පෙර ඊට හොඳ සූදානමක් තිබීම අත්‍යවශ්‍යයි. සෑම මොහොතක දී ම යාච්ඤාවෙන්, දේව වචනය කියවීමෙන්, දෙවියන් වහන්සේ සමග සම්බන්ධ වී සිටීමත් ඉතා සරල දිවි පෙවෙතකට හුරු වීමත් අවශ්‍ය යි. ආහාර පාන ගැනීම , ඇඳුම් පැලඳුම්, ජීවන රටාව සරල වන තරමට දෙවියන් වහන්සේ වෙනුවෙන් ඉටු කිරීමට ඇති සේවය අපහසු වුනත් එය අර්ථවත් වෙනවා.

සුහද අයියා:- දැන් අප හා එක්වන්නේ දිල්හානි නංගි.

දිල්හානි :- ස්නාවක ජොහන්තුමා ඉටු කළ මනස්ථාපනයේ දූත මෙහෙය ගැනයි ඔබ සමග මා අදහස් බෙදා ගන්නේ. ස්නාවක ජොහාන් තුමා ජුදයේ පාළුකරය අවට සැරිසරමින් "පසු තැවී සිත් හරවා ගන්න. මන්ද ස්වර්ග රාජ්‍යය ළඟ ය". (මතෙව්3:2) කියා දේශනා කළා. ජෙරුසලමේ මුළු ජුදයේ ජොර්දාන් අවට

මුළු පෙදෙස් සෙනග මනස්ථාපනයේ බෞතිස්ම ස්නාපනය ලබන්නට ස්නාවක ජොහාන්තුමා වෙත ආවා. ඒ වගේ ම පරිසිවරුන්ගෙන් ද සද්දුසිවරුන්ගෙන් ද බොහෝ දෙනෙක් මනස්ථාපනයේ බෞතිස්මය ලබන පිණිස ඔහු වෙත පැමිණි වේලේ "පොළොං වංශය"කියා ස්නාවක ජොහාන්තුමා ඔවුන්ට ඉතා දැඩි ලෙස ආමන්ත්‍රණය කළා. ඔවුන් ආබ්‍රහම්ගෙන් පැවත එන පුත්‍රයෝ නිසා අහංකාර ලෙස නො සිතන ලෙසට ස්නාවක ජොහාන්තුමා ඔවුන්ට අවවාද කළා. ඒ නිසා සිය පව් ගැන අවංකව පසුතැවිලි වී නැවත පව් නොකරන බවට අධිෂ්ඨානයෙන් මනස්ථාපන බෞතිස්මයේ වටිනාකම අවබෝධ කරගත් හැම ජොහාන්තුමාගෙන් බෞතිස්මය ලැබුවා.

සුහද අයියාඃ- ප්‍රශ්නයක් අසන්නට අවස්ථාව ලබා ගන්නේ කව්ද ?

කවිත් ඃ- පරිසිවරු සද්දුසිවරු වැනි ආගමික නායකයන් පවා ස්නාවක ජොහාන්තුමා වෙත එන්නට විශේෂ හේතුවක් තිබුණා ද ?

සුහද අයියා ඃ- ඔවුන් අනෙක් අය එනවා දැක ආවා මිස අවංකව ම බෞතිස්මය ලබන්නට කැමැත්තක් තිබුණ බව සිතන්නට අමාරුයි.ස්නාවක ජොහාන්තුමාත් එය තේරුම් ගත්තා.එම නිසා ඔවුන්ට පොළොං වංශය කියා ද හැඳින්වූවා. දෙව්නි නංගිට යි දැන් අවස්ථාව.

දෙව්නි ඃ- කිතුනු ජීවිතයට ස්නාවක ජොහාන්තුමාගේ මනස්ථාපනයේ දූත මෙහෙය තුළින් අපට ඉතා වැදගත් පාඩම් රැසක් ඉගෙන ගන්න පුළුවන්. සිතින්, වචනයෙන්, ක්‍රියාවෙන් දිනපතා අප කරන පව් පිළිබඳ ව අවංකව හදවතින් පසුතැවී දෙවියන් වහන්සේගේ කමාව ලබා අලුත් ජීවිත ගත කිරීම ට යොමු වීම අත්‍යවශ්‍ය යි.අපගේ ජීවිත දෙවියන් වහන්සේ ඉදිරියේ ඵල දරන ගසක් බවට පත් වන්නට ඕනේ. අවසාන විනිශ්චයට අප මුහුණ දෙන විට අප සැබෑ ලෙස ම අටුවල රැස්කෙරෙන ධාන්‍ය මෙන් විය යුතු යි. එසේ නොවන විට අප බොල් බව ට පත් වී විනාශය ළඟා කර ගන්නවා.මෙසේ ජොහාන්තුමාගේ මෙහෙය තුළින් ජේසුස් වහන්සේ කෙරෙහි ලැදි ජීවිතාදර්ශය අපි ද ලබමු.

සුහද අයියාඃ- මී ළඟ ඉදිරිපත් කිරීම පසන් මල්ලිගෙන්

පසන් ඃ- ස්නාවක ජොහාන්තුමාගේ දූත මෙහෙය තුළින් ඔප් නැංවුණු නිහතමානී බව පිළිබඳ ව අපි මදක් විමසා බලමු. එතුමා ඉතා නිහතමානි පුද්ගලයකු බව හොඳින් කැපී පෙනෙනවා."මම

නම් ඔබ වතුරෙන් බෞතිස්ම කරමි. එහෙත් මට පසු ව එන තැනැත්තේ මට වඩා බල සම්පන්න ය. මම උන් වහන්සේගේ පාවහන්වල පටිය මුදන්නට වත් නො වටිමි යි" කියා පැවසීමෙන් එතුමා තුළ තිබූ නිහතමානීත්වය විදහා දැක්වෙනවා. තව ද තමා සෙනගට ලබා දෙන මනස්ථාපනයේ වතුර බෞතිස්මයට වඩා උතුම් බෞතිස්මයක් ජේසුස් වහන්සේ පැමිණි කල ලබා දෙන බව එතුමා පවසනවා. එනම් ශුද්ධාත්මයෙන් ද ගින්නෙන් ද ලබා දෙන බෞතිස්මය යි.
මේ කරුණු මගින් ස්නාවක ජොහාන්තුමා තමන්ගේ සේවයේ අගයට වඩා ජේසුස් වහන්සේගේ සේවයේ අගය කියා පෑමෙන් නිහතමානීත්වය ආදර්ශවත් ව දක්වනවා.

ගයනි :- ස්නාවක ජොහාන්තුමා මතුවට සිදුවන කරුණු ජනතාවට කීවේ ඔහු දිවැසිවරයකු නිසා ද?

සුහද අයියා :- ඔව් නංගි ඔහු දිවැසිවරයකු සේ හඳුන්වනවා. ඒ වගේ ම ඔහු දිවැසිවරයකුටත් වඩා ශ්‍රේෂ්ඨ බව ජේසුස් වහන්සේ වරක් ප්‍රකාශ කළා.

සුහද අයියා :- දැන් මම දෙව්නි නංගිට ආරාධනා කරනවා. කිතුනු ජීවිතයට ස්නාවක ජොහාන්තුමාගේ නිහතමානි ජීවිතයෙන් ලැබෙන ආදර්ශය පිළිබඳ ව කථා කිරීමට.

දෙව්නි :- ස්නාවක ජොහාන්තුමා සෑම විට ම ජේසුස් වහන්සේගේ පෙර මග දූතයා සහ මග සාදන්නා ලෙස උන්වහන්සේට ගෞරවය දෙමින් ඉතා නිහතමානි ලෙස සේවය කරමින් දිවි ගෙව්වා. ඒ අයුරින් අපත් දෙවියන් වහන්සේට සේවය කරමු.

සුහද අයියා:- වෙනදා වාගේ ම අදත් වට මේසයේ සැඳැවෙන් අපි බොහෝ දෑ ඉගෙන ගත්තා. යළිත් අපි මේ වගේම හමු වෙමු.

ආදර දෙවි පියාණෙනි ස්නාවක ජොහාන්තුමාගේ පෙරමග දූත සේවය ගැන ඔබවහන්සේට තුති පුදමු. එතුමාගේ ආදර්ශයෙන් සරල නිහතමානි ජීවිත ගත කරන්නටත් සෑම විට ම පව් ගැන මනස්ථාපන වෙමින් දැහැමි මග ගමන් කරන්නටත් උපකාර කළ මැනව. ආමෙන්

## ක්‍රියාකාරකම

1. ස්නාවක ජොහාන්තුමාගේ ජීවිතය තුළ කැපී පෙනුණ ගුණාංග පෙළ ගස්වන්න.
2. ස්නාවක ජොහාන්තුමාගේ මනස්ථාපනයේ දූත මෙහෙය මගින් අපට ලබා දෙන මග පෙන්වීම පැහැදිලි කරන්න.